කුරුණෑගල ප්‍රාදේශීය සභාව

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 සැප්තැම්බර් 12 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 216,407,657 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු28,010,654 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු13,427,594 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). වර්ෂ 03 කට වඩා වැඩි කාලයක් තිස්සේ පවතින රු.3,223,380 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ 5 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් බැංකු සැසඳුම අනුව බැංකු ගිණුම ක ට අදාලව රු.38,775 ක් වටිනා අගරු චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ). ජාතිය ගොඩනැගීමේ අරමුදලට පරිත්‍යාග කිරීම සඳහා සභා සෙවකයන්ගේ වැටුපෙන් අයකරගත් හා මන්ත්‍රීවරුන් විසින් පරිත්‍යාග කරන ලද රු.77,123 ක මුදලක් එම අරමුදල වෙත ප්‍රේෂණය නොකොට වර්ෂ 02 ක පමණ කාලයක සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 1,809 | 1,782 | 2,018 |
| (ii). | බදුකුලී | 2,160 | 1,984 | 628 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 3,205 | 2,688 | 680 |
| (iv). | වෙනත් ආදායම් | 66,363 | 60,336 | 7,339 |

2.3.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 473,124 |
| (ii). | මුද්දර ගාස්තු | 6,000,000 |

2.3.3 <u>වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

සමාලෝචිත වර්ෂය අවසානයට, හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.886,621 ක් වූ අතර හිඟ මදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය සහ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 66 රීතිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4 <u>නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්</u>

ගිණුම් විෂයයන් 5 ක් යටතේ වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන රු.2,092,333 ක් වටිනා අචල ජංගම වත්කම් පැවතුණි.

2.5 <u>අවිධිමත් ගනුදෙනු</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව ඉඩම් කට්ටි කිරීම් යටතේ සභාවට ගෙවිය යුතු 1% ක් වූ බද්ද ගෙවීමේ පහසුව සඳහා 2003 දෙසැම්බර් 28 දිනැති අංක 1317 දරණ ගැසට් පත්‍රයේ පලකල දැන්වීමේ 15(3) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළයුතු නිවාස දේපල සංවර්ධන හා ඉඩම් කට්ටිකර විකිණීම පිළිබඳ වාර්තා 2011 වර්ෂයේදී කට්ටිකරන ලද ඉඩම් 18 ට අදාලව ඉදිරිපත් කර නොතිබුණු අතර ඉඩම් 04 කට අදාලව තක්සේරු කල ආදායම මත 1% ක් වූ බදු මුදලින් රු.606,251 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි.

2.6 <u>මානව සම්පත් කළමනාකරණය.</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩල විස්තරය අනුව සභාවට අනුමත පුස්තකාලයාධිපති තනතුරු සංඛ්‍යාව 3 ක් වුවද, එක් තනතුරක් සමාලෝචිත වර්ෂයට අදාලව පුරප්පාඩුව පැවතුණි. එමෙන්ම අනුමත මාර්ග කම්කරු තනතුරු සංඛ්‍යාව 25 වුවද, ස්ථිර මාර්ග කම්කරුවන් 18 දෙනෙකු පමණක් සිටි අතර අනයම් ආදේශක මත 10 දෙනෙකු සභාවෙන් වැටුප් ගෙවීමේ පදනමට සේවයේ යොදවා ගෙන තිබුණි.

(ආ). කම්කරු, මුරකරු, රියදුරු වැනි තනතුරු නාම යටතේ අනුමත සංඛ්‍යාව 44 ක් වූ අතර තත්‍ය ලෙස ඒ යටතේ කම්කරුවන් 37 දෙනෙකු සමාලෝචිත වර්ෂය වන විට සේවයේ යොදවා තිබුණි. එහෙත් එකී තනතුරු නාම යටතේ සහා අරමුදලින් වැටුප් ලබන සේවකයන් 28 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසන් වන විට අනියම්/ ආදේශක පදනමට බඳවාගෙන තිබුණි.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 5,255,450 ක්ව තිබුණි.

(ආ) ආයතනයට අදාලව සංයුක්ත සැළැස්මක් පිළියෙක කර නොතිබුණි.

2.8 <u>අභ්‍යන්තර විගණනය</u>

ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය